සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**12 ශ්‍රේණිය** | **බෞද්ධ ශිෂ්ටාචාරය** | **පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 1 ) | 02. ( 1 ) | 03. ( 2 ) | 04. ( 3 ) | 05. ( 5 ) | 06. ( 3 ) | 07. ( 4 ) | 08. ( 4 ) | 09. ( 2 ) | 10. ( 5 ) |
| 11. ( 2 ) | 12. ( 3 ) | 13. ( 3 ) | 14. ( 4 ) | 15. ( 2 ) | 16. ( 4 ) | 17. ( 4 ) | 18. ( 2 ) | 19. ( 3 ) | 20. ( 4 ) |
| 21. ( 5 ) | 22. ( 4 ) | 23. ( 5 ) | 24. ( 1 ) | 25. ( 4 ) | 26. ( 5 ) | 27. ( 1 ) | 28. ( 2 ) | 29. ( 5 ) | 30. ( 2 ) |
| 31. ( 3 ) | 32. ( 4 ) | 33. ( 3 ) | 34. ( 4 ) | 35. ( 5 ) | 36. ( 3 ) | 37. ( 2 ) | 38. ( 4 ) | 39. ( 5 ) | 40. ( 1 ) |
| 41. ( 3 ) | 42. ( 1 ) | 43. ( 2 ) | 44. ( 2 ) | 45. ( 1 ) | 46. ( 2 ) | 47. ( 4 ) | 48. ( 5 ) | 49. ( 3 ) | 50. ( 5 ) |

(ලකුණු 2x50 = 100)

## II පත්‍රය

(එක් ප්‍රශ්නයකට ලකුණු 20 ක් දෙන්න.)

01. (i) උපතින්ම වර්ණ හතරකට බෙදා තිබීම. මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් බ්‍රාහ්මණ වංශයත්, බාහුවලින් ක්ෂත්‍රියන්ද, වෛශ්‍යයන් කළවාවලින්ද, ශුද්‍රයන් යටි පතුලෙන්ද උපන් බව සඳහන් කර තිබීම.

"බ්‍රාහ්මණෝස්‍ය මුඛවාසීත් .................. යන ශ්ලෝකය ලියා විස්තර කරතිබීම ප්‍රමාණවත්ය.

(ii) මනු ස්මෘතිය 189 දරණ ශ්ලෝකයෙන් ක්ෂත්‍රියවර්ණයට අයත් ස්වධර්ම දක්වා තිබීම.

ප්‍රජානං රක්ෂණ දාන විජයා ධ්‍යයන මේමච

.................. යන ශේලාකය. රාජ්‍යපාලනය, දන්දීම යාග කිරීම, වේදය, ඉගෙන ගැනීම, කාමයෙහි නො ඇලීම.

(iii) ★ ඍග්වේදය ★ යජ්ර්වේදය ★ සාමවත් වේදය ★ අර්ථවන් වේදය ★ මනුස් මෘතිය

ශත පත බ්‍රාහ්මණාදී බ්‍රාහ්මණ සාහිත්‍යයට අයත් ග්‍රන්ථ හෝ ආරණ්‍යක උපනිෂද් යුගයට අයත් ග්‍රන්ථ පහක් නම්කර තිබීම ප්‍රමාණවත්ය.

(iv) බාලෝ පිතුර් වශේ තිෂ්යේත් ප්‍රාණිග්‍රහස්‍ය යෞවනේ

ප්‍රත්‍රානාං හර්තරි ප්‍රේතේ නහජේත් සත්‍රී සමතන්ත්‍රතාම්

බාලකල පියා යටතේත්, යොවුන් වියේදී ස්වාමි පුරුෂයා යටතේත් ස්වාමියා මැරුණු පසු වැඩිමහල් පුතා යටතේත් ජීවත්විය යුතුය.

(v) කාන්තාවට පැවිදිවීමේ අයිතිය හිමිකර දීම, (මහාප්‍රජාපතී, ගෝතමී, ඛේමා, උප්පලාණ්ණා පටාචාරා වැනි කාන්තාව භික්ෂුණී සාසනයේ පැවිදිවී අග්‍රස්ථානයට පත්වීම)

විශාඛා, ඛුජ්ජුත්තරා, නකුල මාතා වැනි කාන්තාවන්ට උපාසිකාවන් ලෙස විශේෂ ආගමික වරප්‍රසාද තහවුරු ලබාදීම.

භික්ෂු භික්ෂුණී උභය පක්ෂයට සමාන අයිතිවාසිකම් හිමව තිබීම.

පිරිමි පක්ෂයට මෙන්ම කාන්තාවන්ටද සමාන ලෙස ආගමික කටයුතුවල නියැලීමට අවකාශය තිබීම.

02. (i) නිර්මාණවාදය බැහැර කිරීම, ඥාණ මාර්ගයට තැනදීම, යාගය ප්‍රතික්ෂේප කිරීම, නිදහස් චින්තනය ඇගයීම ත්‍රිවේදය බැහැර කිරීම, උදක පාරිශුද්ධය බැහැර කිරීම, ආධ්‍යාත්මික ප්‍රගතිය ගරු කිරීම, චින්තන විප්ලවයක් ඇතිකිරීම, දාර්ශනික මතවාද ප්‍රකට කරලීම.

(ii) සුඛෝපභෝගි ජීවන රටාවක් බිහිවීම, එහි ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ නිශ්පාදනය ආරම්භ වීම, බාරණයි වැනි විශාල වෙළ‍ඳ නගර බිහිවීම. දේශීය, විදේශීය වෙළ‍ඳාම් දියුණුවීම. විශාල වෙළඳ ව්‍යාපාර නිසා සිටුවරු නම් වූ ධනවත් පන්තියක් බිහි වීම, භාගරිකරණය ඇතිවීම.

(iii) පුද්ගලයා සිදුකරන හොඳ හෝ නරක කිසිදු ක්‍රියාවක හොදනරක වශයෙන් ඵලයක් විපාකයක් නොලැබෙන බව ප්‍රකාශ කරන ඉගැන්වීමකි.

අත්පා සිඳීම, සිඳවීම, කෙනෙකු තැවීමට පත් කීරීම, ශෝක කිරීම ශෝක කරවීම, අන්සතු දේ ගැනීම, මුසාබස් බිනීම ආදී කවර හෝ ක්‍රියාවක් සිදුකළත් කරවනු ලැබුවත් ඉන් සිදුවන ප්‍රතිවිපාකයක් නැත. (නත්ථි පාපං නත්ථි පාපස්ස ආගබො)

දන්දීම සිල් රැකීම, සත්‍යවචන භාවිතය, ඉන්ද්‍රිය සංවරය ආදියෙන් සිදුවන කුසලයක් නැත. දස කුසල් දස පින්ක්‍රියාවත් ආදිය අනුගමනය කිරීමත් වුවද ඉන් සිදුනව පිනක් නැත. පිනක් පැමිණීමක්ද නැත. (නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමෝ)

(iv) සබ්බ පාරිපාරිතෝ — සියලු ඇල්දියෙන් වැළකීම

සබ්බ වාරි යුතෝ — සියලු සංවරයෙන් යුක්ත වීම.

ස්බබ වාරි බුතෝ — සියලු පව් වළකාලීම

සබ් සාරි ඵුටෝ — මෝක්ෂය ස්පර්ශ කිරීම

නිගණ්ඨ නාථපුත්තතුමා පරම අවිහිංසා වාදියෙකි. ජලය බීමට ගැනීමේදී පවා පාපකර්ම සිදු නොවන අයුරින් එය සිදුකළ යුතු බව පවසයි. කේවලත්සය නමින් හඳුන්වන මෝක්ෂ පද ප්‍රාප්තිය පිණිස චාතුයාම සංවරය නම් වූ ප්‍රතිපදාව ප්‍රගුණ කළ යුතු බව ප්‍රකාශ කිරීම.

(v) ජෛන, ආජීවක, පරිබ්‍රාජක ජටිල ආදී විවිධ ශ්‍රවණ කණ්ඩායම් වලට වාණිජ ප්‍රජාවගේ අනුග්‍රහය ලැබුණි. මිගාර සිටුවරයා එබන්දෙකි. මේ බොහෝ දෙනෙක් පසුව බුදුන්වහන්සේ වටා එක්වූහ. අනේපිඬු සිටිතුමා අසූහාර කෝටියක් වියදම් කර දෙව්රම් වෙහෙර කරවා පූජා කිරීම, විශාඛාව පූර්වාරාමය කරවා පූජා කිරීම, ඝෝෂක සිටුවරයා කොසඹෑනුවර ඝෝෂිතාරාමය, කුක්කුටාරාමය, පාවාරිකාරාමය යන විහාර තුනක් කරවීම, බණ්ඩක ජෝතිය, වැනි සිටුවරු ද බරණැස් සිටුවරයාද ශ්‍රවණ සම්ප්‍රදායට විශාල අනුග්‍රහයක් දැක්වීම.

03. (i) තුණුරුවන් පිළිබඳ විශ්වාසය හා පිළිගැනීමයි. නිවැරදි අවබෝධයෙන් ඇතිකරගන්නා පැහැදීමයි. අවබෝධයෙන් තොරව ඇතිකර ගන්නාපැහැදීම අන්ධ භක්තියයි.

(ii) බුදු සමයේ ශ්‍රද්ධාවත් වෙනත් ආගමික දර්ශකයන් අතර විශාල පරතරයක් තිබීම. අන්‍ය ආගමික දර්ශනවල භක්තිය බිය නිසා ඇති වේ. ප්‍රඥාවෙන් යමක් වටහාගෙන ඇති කරගන්නා ශ්‍රද්ධාව එසේ නොවේ. බුදු සමයේ පෙන්වන ශ්‍රද්ධාව යමෙක් ගැන හෝ යම් ඉගැන්වීමක් ගැන මනා අවබෝධයකින් බුද්ධිය ප්‍රඥව මුල්කරගෙන සිත තුළ හටගන්නා පැහැදීමයි.

(iii) සත්‍යාවබෝධය ශ්‍රද්ධාවෙන් ආරම්භකර ප්‍රඥාවෙන් අවසන්වන බව බුදුදහම පෙන්වා දෙයි. ප්‍රඥාව පහළ කරගැනීමේ බිජුවට ප්‍රඥාවයි. විමුක්තිමාර්ගයේ ආරම්භය ශ්‍රද්ධාවයි. ශ්‍රද්ධාව පදනම් කරගෙන අනුපිළිවෙළින් විමුක්ති මාර්ගයේ ගමන් කිරීමෙන් අවසානයේ ප්‍රඥාවබෝධය පහළ වේ. සප්ත අර්යධර්ම වලින් පළමුවැන්න ශ්‍රද්ධාවයි. ධර්ම මාර්ගයේ ගමන් කරන්නාට ශ්‍රද්ධාව අත්‍යවශ්‍ය අංගයකි. ශ්‍රද්ධාවෙන් තොර ප්‍රඥාවත්, ප්‍රඥාවෙන් තොර ශ්‍රද්ධාවත් ඵල රහිතය.

(iv) යමක් පිළිබඳ හෝ යම් කෙනෙක් ගැන ඇතිකරගන්නා නිවැරදි අවබෝධය අකාරවතී ශ්‍රද්ධාවයි. මෙය බෞද්ධයා තුළ පිහිටිය යුතුම ශ්‍රද්ධාවයි. කරුණු පිළිබඳ නිවැරදි අවබෝධයකින් තොරව ඇතවන පැහැදීම අමූලික ශ්‍රද්ධාවයි. එය ඉවත් කළ යුතුය.

(v) බුදු දහමේ ඉහළම අරමුණ ප්‍රඥාවයි. ඇති තතු ඇති සැටියෙන් දැකීම හෙවත් ඇත්ත ඇති සැටියෙන් දැකීම ප්‍රඥාවයි. ස්ථානබෝධය යනුද මෙයයි. ත්‍රිලක්‍ෂණය තුළින් ලෝකය දකිනවිට ප්‍රඥාව පහළවේ. එය යථාභූත ඤාණ දස්සනයයි.

04. (i) කුසල් අකුසල් / පුඤ්ඤ පාප / සම්මා විච්ඡා / අරිය අහරිය / සාධු අසාධු / යන වචන මගින් පැහැදිලි කිරීම.

අත්භූපනායික ධර්ම ගරු කිරීම යමක් කිරීමෙන් තමාටවන යහපත අයහපත ගැන සිතීම. අනුනට වන යහපත අයහාපත ගැන සිතීම. තමාටත් අනුන්ටත් සිදුවන යහපත අයහපත ගැන සිතීම.

ආධිපතෙය්‍ය ධර්ම අත්තායි පතෙය්‍ය, ධම්මාධි පතෙය්‍ය, ලෝකධි වතෙය්‍ය

විඤ්ඤුපසත්ත විඤ්ඤු ගරහිත යනාදි කරුණු දැක්වීම

ලෝභ, දෝස, මෝහ යන අකුසල සිතිවිලි මුල්වීමෙන් අයහපත් දේ සිදුවන අතර අලෝභ, අදෝස, අමෝපා යන කුසල මූල සිත් මගින් යහපත් දේ සිදු වීම.

(ii) සමාජ සහජීවනයට බලපාන ආකාරය පන්සිල් සුරැකීම තුළින් ජීවිත සුරක්ෂිතතාවත්, දේපොළ සුරක්ෂිත තාවත්, පවුල් පරිසරය සාමකාමී වීමත් සත්‍ය ගරුක වීමත් කායික මානසික නිරෝගීතාවයත් ඇතිවීම.

සමාජ සංවර්ධනයට බලපාන අයුරු පංචශීල ප්‍රතිපත්ති ගරු කිරීමෙන් අධ්‍යාත්මය දියුණුවන අතර එවැන්නන්ගෙන් සමාජයීය භෞතික සංවර්ධනයට දායකත්වයක් ලැබේ. හිංසා නොකරන, සොරකම වංචාව පිටුදකින, දුසිරිත් නැති, නොරවටන, මතින් තොර සමාජයක සියලු යහපත් අංග සංවර්ධනය වේ.

(iii) අල්පේච්ඡතාව මහිච්ඡතාවයේ විරුද්ධ පදයයි. විශාල බලාපොරොත්තු අපේක්ෂා, ප්‍රාර්ථනා තබා නොගැනීම අල්පේච්ඡතාවයයි. සූත්‍රදේශනාවල අල්පේච්ඡතාව අලෝභය ලෙස දක්වා තිබීම. අල්පේච්ඡතා ගුණයෙන් යුත් පුද්ගලයා අසීමිත ආශාවන් පසුපස හඹානොයන අතර සමාජයට අහිත කරදේ නොකරයි. ලෝභය, කාමච්ඡන්දය, රාගය, තෘෂ්ණාව, ඊර්ශ්‍යාව, ක්‍රෝධය, වෛරය, පළිගැනීම් ආදී මානසික දුර්ගුණ නැතිවී සාමකාමී පරිසරයක් ඇති වේ.

පහසුවෙන් පෝෂණය කළ හැකිවීම, ලදදෙයින් සතුටු වීම. සැහැල්ලු දිවි පැවැත්මෙන් යුක්ත වීම, අල්ප කෘත්‍යතාවෙන් යුක්ත වීම මගින් සාමකාමී තෘප්තිමත් ජීවිතයක් පවත්වා ගැනීමට හැකිවීම.

(iv) කාර්ය බහුලත්වයෙන් ඈත්වීම විවේකයයි. දාන, ශීල, භාවනා, පින්කම් හි නිරතවීම, බෝධි පූජා, වන්දනාගමන් යාම, සමාජ සේවා කටයුතු වල නිරත වීම, වෙසක් පොසොන් ඇසළ උත්සව සහ තොරණ පහන් කූඩු බැති ගී ආදිය නැරඹීම හා ඒවායේ නිරත වීම. කඨින පූජා, පෙරහැර ආදිය පැවැත් වීම. බෞද්ධ නාට්‍ය, බෞද්ධ ගීත රසවිඳීම, බෞද්ධ සාහිත්‍ය රසවිඳීම. ස්වභාව සෞන්දර්ය හා නිර්මාණාත්මක බෞද්ධ කලාවන් ආශ්වාදනය කිරීම ආදී කරුණුවලින් කිහිපයක් පැහැදිලි කරතිබීම ප්‍රමාණවත්ය.

05. (i) අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වෙන පරිදි සමාජය විවිධ හේතු සාධක පදනම් කොටගෙන ක්‍රමිකව විකාශනය වූවකි.

පොදු දේපල පරිහරණය, පෞද්ගලිකත්වය දක්වා වෙනස් වීම, ඒ තුළින් සොරකම, ඝාතනය, බොරුව ආදී දුසිරිත් ව්‍යාප්ත වීම.

මෙම සමාජ දුරාචාර පාලනය කිරීම සඳහා මහජන සම්මතයෙන් පාලකයකු පත්කර ගැනීම, හෙතෙම මහා සම්මත රාජ ඛත්තිය යන නම් වලින් හැඳින්වීම.

පව් බැහැර කිරීමේ අදහසින් සමාජයෙන් වෙන්වූ ධ්‍යාන වැඩූ පිරිස බ්‍රාහ්මණ නම් වීම.

මෛථුන සේවනයේ යෙදෙමින් විවිධ කර්මාන්තයන්හි නිරතව ගෘහස්ථ ජීවිත ගත කළ පිරිස වෛශ්‍ය නම් වීම.

පහත් ලාමක ක්‍රියාවන්හි නිරත වෙමින් සමාජ දුරාචාර කළ අය ශුද්‍ර වීම.

(ii) ඊශ්වර නිර්මාණ වාදය පුබ්බේකත හේතුවාදය, නියති පරිණාම වාදය, අහේතු අප්පච්චය (අධිච්ච සමුප්පන්න වාදය) ශාස්වත වාදය, අකිරියවාදය, අමරාවික්ඛේප වාදය වැනි ඉගැන්වීම් දෙකක් අනුසාරයෙන් පිළිතුරු සකස්වී තිබීම ප්‍රමාණවත්ය.

(iii) කාලාම සූත්‍රය, විමංසක සූත්‍රය වැනි සූත්‍රවල දක්වා ඇති පරිදි ස්වාධීන චින්තනය බුදුසමය බෙහෙවින් අගය කරයි. පුද්ගල පෞරුෂය, ඊශ්වරනිර්මාණ වාදය වැනි කිසිදු බාහිර බලවේගයකට යට කොට නැත. නිදහසේ සිතීමටත් ස්වාධීනව තීරණ ගැනීමටත් නිදහස්ව තීරණ ක්‍රියාත්මක කිරීමටත් හැකිබව ආරම්භක ධාතු නික්කම ධාතු පරක්කමධාතු ආදී ඉගැන්වීම් වලින් පැහැදිලි වීම.

අත්තාහි අත්තනො නාථෝ ............

අත්ත දීපා භික්ඛාවේ විහරථ අත්ත සරණා" ආදී වශයෙන්

පුද්ගල ස්වාධීනත්වය තහවුරු කිරීමේදී දේවනිර්මාණ වාදය පුබ්බේකත හේතුවාදය වැනි පාරභෞතික චින්තා ප්‍රතික්ෂේප කිරීම.

(iv) පංචශීල ප්‍රතිපත්තිය වැනි ශික්ෂණ මාර්ගවලින් ආදර්ශවත් ශ්‍රාවකයන් බවට පත්විය හැකි බව අවධාරණය කිරීම.

සීල, සමාධි, පඤ්ඤා වඩන පුද්ගලයන් බහුලව වෙසෙන සමාජය පාරිසුද්ධිය කරා පියනගන ආකාරය

දුසිරිත්, පාපක්‍රියා අපරාධ වැනි සමාජ විරෝධී ක්‍රියාවලින් එක් එක් පුද්ගලයා වෙන්කළ විට සමාජ පාරිසුද්ධියක් ඇතිවන බව පෙන්වා දීම.

සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන පුද්ගල යුතුකම් නිසි ලෙස ඉටුකිරීමෙන් සහජීවනයෙන් යුතු දැහැමි සමාජයක් බිහි කළ හැකි බව.

අත්තභාව කතංපාපං අත්තනා සංකිලිස්සති

අත්තාන චේව පඨමං පතිරූපෙ නිවේසයෙ ආදී කරුණු පදනම් කරගනිමින් පුද්ගල පාරිසුද්ධිය මත සමාජ පාරිසුද්ධිය සිදුවන බව.

06. (i) චක්කවත්තී සීහනාද සූත්‍රයේ දැක්වෙන දස සක්විතිවත් කෙටියෙන් විස්තර කර තිබීම ප්‍රමාණවත්ය. නම් කර තිබීම වුවද ප්‍රමාණවත්ය.

(ii) සප්ත අපරිහාණීය ධර්ම යහපත් රාජ්‍ය පාලනයකට හේතුවන ආකාරය පෙන්වා තිබීම පිළිතුරෙහි අන්තර්ගත විය යුතුය. (නම් කිරීමට ලකුණු 02 යි. විස්තර කිරීමට ලකුණු 03 යි.)

(iii) එම පාක්ෂිකයන්ට විශේෂ සැලකිලි දක්වමින් අන්‍යයන්ට අසාධාරණ කම් කිරීම ඡන්දයේන අගතියට යාමයි.

විරුද්ධ වාදීන්ට හතුරු කම් කරමින් වැරදි ලෙස තීරණ ගෙන ක්‍රියා කිරීම ද්වේෂයෙන් අගතියට යාමයි.

මධ්‍යස්ථව සිටිය යුතු අවස්ථාවලදී විවිධ හේතු නිසා බියෙන් වැරදි තීරණ ගැනීම බියෙන් අගතියට යාමයි.

නිවැරදි දේ තේරුම් ගැනීමට නොහැකි වී යාම හෙවත් අනවබෝධය නිසා වැරදි තීරණ ගැනීම මෝහයෙන් අගතියට යාමයි.

මෙම සතර අගතියෙන් වැළකී කටයුතු කිරීම සාධාරණ දේශපාලනඥයකුගේ ප්‍රතිපත්තිය විය යුතු බව පැහැදිලි කළ යුතු වේ.

(iv) කූට දන්ත සූත්‍රයේ දැක්වෙන ආකාරයට ආර්ථිකය නගා සිටුවීමට පාලකයා විසින් කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්ට ඉඩම්, වාරි පහසුකම් කෘෂි උපකරණ ශිල්පීය ඥාණය ලබා දීම.

වෙළඳාමේ නිරත වූවන්ට, කිරුම් මිණුම් උපකරණ, මිළ පාලන ප්‍රතිපත්ති, ශිල්පීය ඥාණය,වෙළඳ එල ප්‍රවාහන පහසුකම් හා ප්‍රාග්ධනය සැපයීම.

රාජ්‍ය සේවයේ නියතුවූවන්ට නිසි බත් වැටුප් දීම.

ආර්ථික අපහසුතා ඇති අවස්ථාවල හා අලුතින් නව කර්මාන්ත ආරම්භ කරන අවස්ථාවල ප්‍රාග්ධනය සැපයීම.

ආර්ථික පරිහානියට හේතුවන සාධක ඉවත් කිරීමට කටයුතු කිරීම.

දසරාජ ධර්මය ක්‍රියාත්මක කිරීම. පංචශීල ප්‍රතිපදාව ක්‍රියාවට නැගීම.

07. (i) බුද්දික නිකායේ ථේරගාථාවල සඳහන් රහතන් වහන්සේලා කිහිපනමක් පාරිසරික රමණීයත්වය විඳගත් ආකාරය දක්වා තිබීම ප්‍රමාණවත්ය.

(ii) රමණීයානි අරඤ්ඤානි යත්ථනරවතී ධනො

විතරාගා වෙස්සන්ති නතෙ කාම ගවේසිනෝ

පරිසරය මිනිස් සිත කිසිවිටෙකත් දූෂ්‍ය නොකරයි. සිත කිලිටි කරන්නේ නරක සිතිවිලිය. පරිසරය ස්වාබාවික හිතකරවන බැවින් නැවත අප පරිසරයට පෙරළා හිතකාමී විය යුතු බව බුදු දහමින් පෙන්වා දෙයි.

මහා පරිනිබ්බාණ සූත්‍රයේ දැක්වෙන ආකාරයට යන්තම්භක සාරන් දද, චාපාල චෛත්‍ය වර්ණනා කිරීම.

කකුත්ථානදී, අජකරණී ඉසිගිලි පර්වත වැනි සුන්දර ස්ථාන වැනීම.

පංච සිඛගේ වීනා වාදනය හා ගායනය අගය කිරීම

සංගීතය, ගීතය, නාට්‍ය, චිත්‍ර, මූර්ති, කැටයම් වැනි කලාත්මක නිර්මාණයන්හි සුන්දරත්වය බුදු සමය මගින් ඇගයීමට ලක් කිරීම.

(iii) ධාර්මික ධනය ඉපයීමෙන් ලබන සතුට අනවජ්ජසුඛයයි.

පස්පව් දස අකුසල් වලින් වැළකී දැහැමි ජීවිතයක් ගොඩ නගා ගැනීම.

අංගුත්තර නිකායේ අණන සූත්‍රයට අනුව ආත්ම ශික්ෂණයෙන් යුක්තව පරාර්ථ චර්යාවේ යෙදෙමින් ධාර්මික බෞද්ධ ජීවිතයක් ගත කිරීමට ඉහත දැක් වූ කරුණු උපයොගී වන ආකාරය පැහැදිලි කර තිබිය යුතුය.

(iv) පංච විධ අධාරමික වෙළඳාමෙන් වැළකීම.

තුලාකූට, මානකූට, කංසකූට ආදී වෙළඳාමේදී යොදා ගනු ලබන අධාර්මික වෙළඳාම් ක්‍රමවලින් වැළකී කටයුතු කිරීම.

මිච්ඡා ආජීවයෙන් වැළකී සම්මා ආජීවයෙන් යුතුව ක්‍රියා කිරීම.

ආර්ථික සමෘද්ධියෙහිලා බුදු සමය සහාසික බව හා අධාර්මික බව සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීම.

08. (i) රහමෙරපානය, අවේලාවේ වීථි සංචාරය, සමච්ඡාභිචරණය (අනවශ්‍ය ලෙසට විනෝද වීමට යාම) දුකෙළිය, පාපමිත්‍රසේවනය අලසකම, මෙම කරුණු කෙටියෙන් විස්තර කර තිබීම ප්‍රමාණවත්ය.

(ii) බුදු සමයට අනුව ධනය වනාහි ගොඩ ගසා ගත යුත්තක් නොව සංසරණය විය යුතුදෙයකි. (කෝසල සායුක්තිය පඨාවාදුතියා සූත්‍ර

උපයන ධනයෙන් තමා පිනවීම, දෙමාපියන් පිනවීම, අඹුදරුවන් පෝෂණය කිරීම, මිත්‍රාදීන් පිනවීම, දැසිදස් කම්කරුවන් පිනවීම, සංඝ දක්ෂිණ විෂයෙහි යෙදවීම කළ යුතුය.

භෝග සුඛය. (අණන සූත්‍රය) පංචබලි සංකල්පය

සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන යුතුකම් ඉටු කිරීම.

සත් පුරුෂයොගේ ධනය පස් පියුමෙන් සැදී සිසිල් දිය පිරුණු රකුසන් අරක් නොගත් මිලක් මෙන් බොහෝ දෙනාගේ යහපතට හේතු වේ. මෙම කරුණු ඇසුරින් පිළිතුරු සකස් විය යුතුය.

(iii) සිඟාලෝවාද සූත්‍රයේ අලසකමේ ආදීනව හයක් දක්වා තිබීම.

★ ඉතා සීතයයි කටයුතු අපහසු කරයි. ★ ඉතා උෂ්ණ යැයි කටයුතු අතපසු කරයි. ★ ඉතා සවස්කාලය යැයි කර්මාන්ත නොකරයි. ★ ඉතා උදෑසන යැයි කර්මාන්ත නොකරයි. ★ ඉතා බඩගිනියැයි කර්මාන්ත නොකරයි. ★ ඉතා වැඩියෙන් ආහාර ගත්තයැයි කර්මාන්ත නොකරයි.

අලසකමට පුරුදු වූ පුද්ගලයාගේ මෙලොව ජීවිතය මෙන්ම පරලොව ජීවිතයද පිරිහෙයි.

නිවන්මග ආවරණය කරන නීවරණ ධර්මවලින් එකක් ලෙස දක්වා ඇත්තේ ද අලසකමයි.

(iv)
- ★ තරගකාරීලෙස බාහිර අලංකාර හා ආටෝප ප්‍රදර්ශනය කිරීමට මුල්තැන නොදී මූලික අවශ්‍යතා සපුරා ගැනීමෙන් තෘප්තිමත් වීම.
- ★ කරණීය මෙත්ත සූත්‍රයේ "සල්ලහුකවුත්ති" යනුවෙන් දක්වා ඇත්තේ සැහැල්ලු දිවි පැවැත්ම විමුක්ති සාධනයට ඉවහල්වන කුසල කර්මයක් ලෙසිනි.
- ★ බොහෝ බාහිර ලෞකික කටයුතු භාර නොගෙන සැහැල්ලු අයුරින් දිවිපවත්වාගෙන යාම "අප්පකිච්චතාවයි"
- ★ කායික මානසික සංවර්ධනයට අල්ප කෘත්‍යතාව හේතු වේ.
- ★ අල්පකෘත්‍යතාවෙන් වෙන්වූ විට මිනිසාගේ මනස අවුල් වේ.
- ★ බොහෝ නිලතල හෝ බොහෝ වගකීම් භාරගැනීමෙන් කළ යුතු කටයුතු සියල්ල මග හැරේ. අතපසුවෙයි. අසාර්ථක වෙයි.
- ★ බහු භාණ්ඩික වීමෙහි ආදීනව හා බහු භාණ්ඩික නොවීමේ අනුසස් පරමත්ථ ජෝතිකාවෙහි දැක්වෙයි.

ඉහත කරුණු පදනම් කොටගෙන පිළිතුරු සකස් වීම ප්‍රමාණවත්ය.

**I** පත්‍රය $50 \times 2 = 100$

**II** පත්‍රය $50 \times 2 = 100$

$200 / 2 = 100$

The National e-Learning Portal for The General Education